# බළන්ගොඩ නගර සභාව

## 2019-01-08 වන දිනැති මහා සභාවේ රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.01.08**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | අකිල සාළිය එල්ලාවළ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ප්‍රධාන කළමණාකරන සහකාර | ජී.ඩී.ඒ.සේමපාල මිය |

01. **පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

2019-01-09 වන දින මාසික මහසභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමන් විසින්,2018.12.13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඞී. සමරසේකර මැතිතුමිය විසින් 2018.12.13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදුව එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

02. **ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

●ගරු සභාපතිතුමන් විසින් නිවේදන ආරම්භ කරමින් , අද දින සභාවට නොපැමිණි ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා අසනීපව රෝහල් ගත කර ඇති බවට ලිපියක් ඉදිරිපත් කල ඇති බවත්, එතුමාගේ නිවාඩු අනුමත කිරීමත්, ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන්ගේ පවුලේ අවමංගල්‍යයක් බවට සිදුකරන ලද දැනුම් දීමට අනුව එතුමාගේ නිවාඩු අනුමත කිරීමත් සිදුකරන බවට ගරු සභාපතිතුමන් විසින් මෙහිදී සභාවට දැනුම්දෙන ලදී.

● ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් සභාවේ ගරු මන්ත්‍රිවරුන් විසින් සභාවට නිරන්තරයෙන් සංවර්ධන යෝජනා ඉදිරිපත් කලද, එම යෝජනා සියල්ල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සභාව සතුව නොමැති බැවින්, මෙතෙක් භාරගත් යෝජනා ක්‍රියාත්මක කරන තෙක් නැවත සංවර්ධන යෝජනා ඉදිරිපත් නොකරන ලෙස ඉල්ලා සිටි අතර මේ පිළිබඳව පළාත් සභාවෙන් දැනුම් දුන් ලිපියේ පිටපතක් සෑම සාමාජිකයෙක් වෙතම ලබාදී ඇති බව පවසා සිටින ලදී. එමෙන්ම ඉදිරියේදි නඩත්තු කටයුතු සම්බන්ධ යෝජනා සභාවට ඉදිරිපත් කර කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.බලංගොඩ නගරයේ කුමන ස්ථානයක සංවර්ධනය සිදු කලද පෞද්ගලිකව කිසිදු අයෙක් ඒවා අරන් නොයන අතර සිදුවන්නේ ප්‍රදේශය සංවර්ධනය වීම බව ගරු සභාපතිතුමන් විසින් වැඩි දුරටත් පවසා සිටින ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා /ටෙන්ඩර් විවෘත කිරීම ඉදිරිපත් කිරීම.**

1.සංදේශ ,පැමිණිලි , පෙත්සම් හා ආයාචනා ඇත්නම් සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් පවසා සිටි අවස්ථාවේ **ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් කරුණු දක්වමින්,**

●දෙහිගස්තලාව ටකරන් කඩය අසළ පදිංචි වෛද්‍ය මාතොට ආරච්චි මහත්මිය විසින් තම නිවසට අනතුරුදායක ලෙස පිහිටා ඇති ගසක් පිළිබඳ ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

●දෙහිගස්තලාව ටකරන් කඩය අසළ පදිංචි වෛද්‍ය මාතොට ආරච්චි මහත්මිය විසින් කරන ලද ඉල්ලීමකට අනුව,ඔහුගේ නිවසට යාබද මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් කරන ලද ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින්, අනතුරුදායක ලෙස පිහිටා ඇති ගස පිලිබඳව පරීක්ෂා කර බලා සුදුසු පියවර ගන්නා ලෙස වැඩ අධිකාරී වෙත උපදෙස් ලබාදෙන බවත්, ඇයගේ නිවසට යාබද මාර්ගය නගර සභා බල ප්‍රදේශයට අයත් වූවක්ද යන්න පරීක්ෂා කර බලා අවශ්‍ය සංවර්ධනය පිළිබඳව වැඩ අධිකාරී ලවා පරීක්ෂා කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන බවත් පවසා සිටින ලදී.

●එමෙන්ම පසුගිය සභාවාරයේදී දන්වා සිටි පරිදි සේනක පෙදෙස සරත්චන්ද්‍ර ගරාජ් වෙතින් කාබයිඩ් පිච්චීම නිසා ඇතිවන දුගඳ නිසා මහජනතාව මහත් පීඩාවකට ලක් වීම හා මෙය සෞඛ්‍යයට හානිදායක තත්වයක් බවට මහජන පැමිණීලි ලැබෙන බවට සභාව වෙත කරුණු ඉදිරිපත් කලද මේවන තෙක් එයට විසඳුම් ලැබී නැති බව ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් පවසා සිටි අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් මේ සඳහා නගර සභාව මගින් නිකුත් කරන වෙළෙඳ බලපත්‍රය ලබා නොදීම සුදුසු බවට පවසා සිටින ලදී. එහිදී ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා වෙළෙඳ බලපත්‍රය නිකුත් නොකිරීමටත්, මහජන පැමිණිලි පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය දැනුවත් කර ලිපියක් සකස් කිරීමටත් අවශ්‍ය උපදෙස් ලබාදෙන බව පවසා සිටින ලදී.

**2. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් අදහස් දක්වමින්**

●වැවවත්ත ප්‍රජා එකමුතුව මගින් කරන ලද ඉල්ලීමකට අනුව වැවවත්ත උද්‍යානයේ ප්‍රධාන මාර්ගයේ ඇති කොන්ක්‍රීට් කාණු පද්ධතිය නිසියාකාරව සකස් කර නොමැති හෙයින් නිතර ජලය රදා පැවතීම නිසා ඩෙංගු අවදානමකට මුහුන පා ඇති බවත් එම කාණු පද්ධතිය නිසි පරිදි සකස් කර දෙන ලෙස ඉල්ලා කරන එවන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාවට ඉදිරිපත් කල අතර ඒ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් මේ පිළිබඳ අවශ්‍ය පියවර ගැනීම සඳහා පරීක්ෂා කර බැලීමට වැඩ අධිකාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කරන බව පවසා සිටින ලදී.

● බුළත්ගම තානායම්ගෙදර වත්ත පාර ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ නිවෙස්වලට ජලය ලබාගැනීම සඳහා මෙම මාර්ගයේ මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තු නිදහස් කරදෙන මෙන් එම නිවැසියන්ගේ ඉල්ලීම සහිත ලිපිය ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් සභාවට යොමුකල අතර එම ගාස්තු නිදහස් කරදෙන මෙන් ඉල්ලා සිටිමේදි එයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් මාර්ග උරහිස සඳහා ගාස්තු නිදහස් කිරීමටත්, තාර හෝ කොන්ක්‍රීට් කර ඇති මාර්ග පළුදු වේ නම් ඒ සඳහා අදාළ ගාස්තු අයකර අවශ්‍ය අවසරය ලබාදෙන බවත් පවසා සිටින ලදී.

3. **ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා අදහස් දක්වමින්** ගල්වල මාර්ගයේ පදිංචිකරුවන් පිරිසක් විසින් ගල්වල මාර්ගයේ මීටර 200 පමණ දුර ප්‍රමාණයක් ඉතා අබලන් තත්වයේ ඇති බැවින් එය සංවර්ධනය කර දෙන ලෙස කරන ලද ඉල්ලීම, සභාවට ඉදිරිපත් කල අතර ඒ සඳහා ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.ගරු සභාපතිතුමන් විසින් මෙයට පිළිතුරු ලබාදෙමින් මේ සඳහා විමධ්‍යගත අරමුදල් සපයාගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

4. **ගරු නාගරික මන්ත්‍රී පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින්** බලන්ගොඩ රණවිනාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ නිවෙස්වලට ජලය ලබාගැනීම සඳහා මෙම මාර්ගයේ මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තු නිදහස් කරදෙන මෙන් එම නිවැසියන්ගේ ඉල්ලීම සභාවට යොමුකල අතර එම ගාස්තු නිදහස් කරදෙන මෙන් ඉල්ලා සිටිමේදි එයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් මාර්ග උරහිස සඳහා ගාස්තු නිදහස් කිරීමට එකඟත්වය පලකරන ලදී.

**04. කල් දී ඇති ප්‍රශ්න**

බලංගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමර සම්බන්ධයෙන් 2018-12-02 දින බනස/ආ/04/03/06 ලිපියේ කරුණු සම්බන්ධව ගරු සභාවේ කරුණු විමසීම සඳහා නැවත එම ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටීම. **(ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා)**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා විසින් කරන ලද ඉල්ලීමට අනුව බලංගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමර සම්බන්ධයෙන් 2018-12-02 දින බනස/ආ/04/03/06 ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා විසින් මැණික් කඩ කාමර හිමියන් වෙත යවා ඇති 2018.12.02 යවා ඇති ලිපියේ පරිදි 2019 ජනවාරි සිට අදාළ තක්සේරුව ක්‍රියාත්මක කිරීමට මහ සභා තීරණ 04:02:02 යටතේ 2018.11.08 සභාවේ තීරණයක් ගෙන නොමැති බවත් මෙහි වරදක් සිදු වීඇති බවත් පවසා සිටින ලදි.

මේ සම්බන්ධව කරුණු සොයා බැලූ ගරු සභාපතිතුමන් විසින් මැණික් කඩ කාමර හිමියන් වෙත 2018.12.02 යවා ඇති ලිපියේ පරිදි මහ සභා තීරණ 04:02:02 යටතේ 2019 ජනවාරි සිට අදාළ තක්සේරුව ක්‍රියාත්මක කිරීමට සභාවේ සියළු දෙනා එක්ව 2018.09.13 මහ සභාවේ ඒකමතිකව අනුමත කරගෙන ඇති බවත් මැණික් කඩ කාමර හිමියන් වෙත යවන ලද ලිපියේ සභා වාර්තා දිනය සඳහන් නොකිරීමේ අතපසු වීම විනා වෙනත් වරදක් සිදු වී නොමැති බව පවසා සිටින ලදී.

05. **කල් දී ඇති යෝජනා**

**05:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**05:01:01 බැංකියවත්ත නඩු පිළිබඳව සභාවේ තීරණයක් ගැනීම**

බැංකියවත්ත නඩු පිළිබඳව සභාවේ තීරණයක් ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් මෙම නඩුවලට සම්බන්ධ දෙපාර්ශවය විසින් නැවත ඒ සඳහා ඉදිරිපත් නොවන බවට කොන්දේසි ලබාගෙන මෙම නඩුව ඉවත්කර ගැනීම සුදුසු බව පවසා සිටින ලදී. එමෙන්ම බැංකියවත්ත කසළ කන්ද නාය යාම හේතුවෙන් හානීයට පත් වූ කුඹුර සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුකර ඒ සඳහා සුදුසු පිළියමක් යොදන මෙන් වැඩිදුරටත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් මෙහිදි නඩු දිනයට කළින් කොන්දේසි පනවා ගත යුතුබව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් අදහස් දක්වමින් මේ දක්වා නගර සභාව මගින් මෙම නඩු සඳහා ගෙවූ නඩු ගාස්තු සම්බන්ධයෙන් කුමක් වේදැයි විමසා සිටින ලදී.

මෙම නඩු ගාස්තු සහ කසළ පැල්මඩුල්ලට බැහැර කිරීම දක්වා ගෙන ගිය ප්‍රවාහන වියදම් සභාවට අධිභාරයක් විය හැකි බව ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් එම කාල වකවාණුව තුළ එවන් කසළ ප්‍රශ්න රට තුළ ඇතිවී කසළ යම් යම් ස්ථාන කරා බැහැර කිරීම සඳහා ප්‍රවාහනය කිරීමට සිදු වූ බැවින් පැල්මඩුල්ලට බැහැර කිරීම දක්වා ගෙන ගිය ප්‍රවාහන වියදම් සභාවට අධිභාරයක් නොවන බව මෙහිදී පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් අදහස් දක්වමින් මෙම නඩුව සභාවේ නිළධාරීන් එක්ව ගොනුකරන ලද්දක් බැවින්,එය ඉවත්කිරීම සම්බන්ධව තීරණයක් ගැනීමට සභාවට හැකියාවක් ඇත්දැයි විමසා සිටින ලදී. ඒ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් එවකට නිළධාරීන් සභාව ලෙස පෙනීසිටිය බැවින් ඉන් ගැටළුවක් මතු නොවන බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින් මෙම නඩුව සම්බන්ධ ගම්වැසියන් ගැන සිතා නඩු ඉවත්කර ගැනීමට සිතුවද ඉන් සභාව හා නිළධාරීන්ට යම් යම් ප්‍රශ්න ඇතිවීමට ඉඩකඩ ඇතිනම් ඒ පිළිබඳවද සිතා බැලිය යුතු බැවින් නගර සභා නීතිඥවරයා හමුවී සභාව විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි සකස් කර එයට එකඟත්වය පළකර පසුව

මෙම නඩුවේ කොන්දේසි පිළිබඳව දැනුවත් වී ඒ සඳහා දෙපාර්ශවයේම එකඟත්වය ලද පසුව විශේෂ සභාවක් කැඳවා හෝ මේ පිළිබඳව නිසි තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ02 අක්කර බදු,වරිපනම් බදු ,කේ පෝරම ලිවීම,පරීක්ෂා කිරීම හා බෙදීම සඳහා සංශෝධිත නව ගාස්තු පිළිබඳ චක්‍රලේඛය පිළිබඳ සභාව දැනුවත් කර ගෙවීම් සම්බන්ධව සභා අනුමැතිය ගැනීම**

අක්කර බදු,වරිපනම් බදු ,කේ පෝරම ලිවීම,පරීක්ෂා කිරීම හා බෙදීම සඳහා සංශෝධිත නව ගාස්තු පිළිබඳ චක්‍රලේඛය පිළිබඳ සභාව දැනුවත් කර ගෙවීම් සම්බන්ධව සභා අනුමැතිය ගැනීම සම්බන්ධ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

එහිදී ගරු සභාපතිතුමන් විසින් ප.පා.කො. චක්‍රලේඛ CLG/LG/ 1 / 5 /2018 / 14 හා 2018.12.13 අනුව සංශෝධිත ගාස්තු ,ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- වරිපනම් බදු / අක්කර බදු තක්සේරු දැන්වීම් ලිවීම රු.4.00
- වරිපනම් බදු / අක්කර බදු තක්සේරු දැන්වීම් පරීක්ෂා කිරීම රු.2.00
- වරිපනම් බදු / අක්කර බදු තක්සේරු දැන්වීම් බෙදීම ඒකක 1 රු.8.00
- වරිපනම් බදු / අක්කර බදු ලේඛන ලිවීම ඒකක 1ට රු.2.00
- වෙළෙඳ බලපත්‍ර ලේඛන ලිවීම ඒකක 1ට රු.2.00
- ආදායම් පරීක්ෂකවරු නොමැති පළාත් පාලන ආයතනවල බලපත්‍ර ගාස්තු ඉල්ලුම්පත් ලබාගැනීම රු. 8.00

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ01ඃ03 **කුලී පදනම මත ලබාදුන් කඩකාමර ලියාපදිංචිය වෙනස් කර ගැනීම.( එච්.කේ. නන්දනී අල්විස්) I. කඩ කාමර අංක 1, අංක 2 පොදු වෙළෙඳ සැල**

**II. මැණික් කඩ ගොඩනැගිල්ල, අංක 6, කෙලින් වීදිය**

**III. නව බස්නැවතුම්පළ සී 17 කඩකාමරය**

කුලී පදනම මත ලබාදුන් කඩ කාමර අංක 1, අංක 2 පොදු වෙළෙඳ සැල / මැණික් කඩ ගොඩනැගිල්ල, අංක 6, කෙලින් වීදිය/ නව බස්නැවතුම්පළ සී 17 කඩකාමරය යන කඩකාමර සඳහා ලියාපදිංචිය වෙනස් කර ගැනීම සඳහා එච්.කේ. නන්දනී අල්විස් විසින් කරන ලද ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමන් විසින් නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව මෙය සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ01ඃ04 **සේවා ගිවිසුම් අළුත් කිරීම**

**I. එන් හේමන්ති මිය සෞඛ්‍යය කම්කරු**

**II. කේ.පී.කුසුමලතා මිය සෞඛ්‍යය කම්කරු**

සෞඛ්‍යය කම්කරුවන් වන එන් හේමන්ති මිය හා කේ.පී.කුසුමලතා මියගේ 2019 වර්ෂය සඳහා සේවා ගිවිසුම් අළුත් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ01ඃ05 **2019 වර්ෂය සඳහා පොදු වෙළෙඳ සැල කඩ අංක 07 කඩ කාමරය හා රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම ටෙන්ඩර් මණ්ඩල තීරණය සඳහා මහ සභාවේ අනුමැතිය ලබාගැනීම.**

2019 වර්ෂය සඳහා පොදු වෙළෙඳ සැල කඩ අංක 07 කඩ කාමරය සඳහා 2019 වර්ෂය සඳහා සුදුසු ගැනුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා 2018-10-11 දින නගර සභා කාර්යාලයේදී ලංසු පත් විවෘත කලද පොදු වෙළෙද සල අංක 7 දරණ කඩ කාමර සඳහා එක් ලංසුපතක්වත් නිකුත් නොවූ හෙයින් ඒ පිලිබඳ මහ සභාවේදී තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් මෙලෙස එකම කඩ කාමරක් සඳහා වරින් වර පුවත්පත් දැන්වීම් පලකිරීම තුළින් කාලය හා මුදල් අපතේ යාමක් සිදුවන බැවින් සභාවේ සියළු දෙනා තීන්දුවක් ගෙන වර්තමාන ලංසු මුදලින් 20% ක ප්‍රමාණයක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බවත් එම ලංසුපත් මීළග සභා වාරයේදි විවෘත කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.මේ සඳහා සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය සඳහා ලංසුපත් කැඳවීමේදි නිකුත් වූ ලංසුපත් හතර අතරින් වැඩිම ලංසු මුදල ලෙස ලද පී.රංජිත් කුමාරසිරි මහතා ඉදිරිපත් කර තිබූ රු.151,132.00 ක ලංසු මුදල ඔහු පිළිනොගත් බැවින් ටෙන්ඩර් මණ්ඩලය ඊළගට වැඩිම මුදල වූ රු.145,083.10 ක මුදල ඉදිරිපත්කර තිබූ ගුණදාස ශාන්ත කුමාර මහතාගේ ටෙන්ඩරය පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය ගත් තීරණයට ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ06 රථවාහන ටෙන්ඩරයේ ගාස්තු නිදහස් කරගැනීම .පී.ශාන්ත කුමාර**

පී.ශාන්ත කුමාර විසින් රථවාහන ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කර දෙන මෙන් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී මේ පිළිබඳ ගරු සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව 2019 වර්ෂයේ සෑම පොහොය දිනක්ම,අප්‍රේල් මස 13,14,15 සහ මැයි 01 වන දින ඇතුළු දින 16 ක් රථවාහන නැවතීමේ ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ07 රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරයේ ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීමට අනුමැතිය**

පී.ඒ.සුජීව කුමාර මහතා හා ටී.ඒ.සී.මලිත් නිශාන්ත මහතා විසින් 2018.12.13 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීමට අනුව රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරයේ ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීමට අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ08 සතිපොළ තක්සේරුව ක්‍රියාත්මක කිරීම**

2019 වර්ෂයේ ජනවාරි මස සිට බලන්ගොඩ නගර සභාව මගින් සතිපොළ පවත්වාගෙන යනු ලබන අතර 2019 වර්ෂයේ ජනවාරි මස 13 වන ඉරිදා සිට සතිපොළ තක්සේරුව ක්‍රියාත්මක කිරීමත් ඒ සඳහා පොළ මඩුවක් සඳහා රු.250.00 ක්ද දෛනික වෙළදාමේ යෙදීම මත රු.75.00 ක්ද අයකිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ09 2019 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සභාගත කිරීම**

2019 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සභාගත කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ10 2019 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු සභාගත කිරීම.**

2019 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු සභාගත කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික

මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:11 2018 ඔක්තෝබර් කියවීමේ මාසය ත්‍යාග හා සහතික පත් ප්‍රදානෝත්සවය**

2018 ඔක්තෝම්බර් කියවීමේ මාසය ත්‍යාග හා සහතික පත් ප්‍රදානෝත්සවය සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:12 බුළත්ගම තළාව පාර අංක 245/11 හි පර්චස් 6.41 ක බිම් ප්‍රමාණය පැටිකිරිය ලබාගත් පසු සාකච්ඡා කර තීරනයක් ගැනීම සම්බන්ධව**

බුළත්ගම තළාව පාර අංක 245/11 හි පර්චස් 6.41 ක බිම් ප්‍රමාණය පැටිකිරිය ලබාගත් පසු සාකච්ඡා කර තීරනයක් ගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර මේ සම්බන්ධව ක්‍රියා මාර්ගයක් ගැනීමට පෙර නීතිඥ්‍ය උපදෙස් ලබාගෙන ඉන් පසු නිසි ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**හදිසි යෝජනා**

**05:01:13 සී 18 කඩකාමරය පැවරීම මොහොමඩ් ජාමීල්**

මොහොමඩ් ජාමීල් මොහොමඩ් ෆවුස් පදිංචිය හැර වෙනත් ස්ථානයක පදිංචියට යන බැවින් තමාට හිමි බස් නැවතුම්පොළ සී 18 කඩකාමරය ඔහුගේ ඥාති සහෝදරියක් වන මොහොමඩ් තාහීර් නුරුස්සකි යන අයට පවරා දීමට අනුමැතිය පතමින් ඉදිරිපත් කල ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එහිදී මේ පිළිබඳව සභාවේ සාකච්ඡා කිරීමෙන් පසුව නීත්‍යානුකූල ක්‍රම වේදය අනුව කීමනි මුදලින් 25% ක් සභාවට අයකරගෙන අනුමැතිය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:14 බැංකියවත්ත පිල්ටරය ඉදිකිරීම පිළිබඳව සභා තීරණයක් ගැනීම.**

බැංකියවත්ත පිල්ටරය ඉදිකිරීම පිළිබඳව සභා තීරණයක් ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමේදි ගරු සභාපතිතුමන් විසින් මෙම පිල්ටරය ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 35 ක පමණ මුදලක් වැයවේ යැයි ගණන් බලා ඇති බව පවසා සිටින ලදී.එහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් මෙතෙක් නගර සභාව මගින් ඉදිකරන ලද පිල්ටර් සියල්ල අසාර්ථක වූ හෙයින්, මෙම ප්‍රදේශයේ සාර්ථක ලෙස නිමකර ඇති පිල්ටර් පිළිබඳව අවධානය යොමුකර,නිසි උපදෙස් අවශ්‍ය පරිදි ලබාගත් පසු මෙම ඉදිකිරීම ආරම්භ කරන ලෙස පවසා සිටි අතර මෙම පිල්ටරය නිරන්තරයෙන් අධීක්ෂණය කල හැකි පරිද්දෙන් ඉදිකිරීම් සිදුකරන ලෙස පවසා සිටින ලදී. ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් මේවන විට සාර්ථකව හොඳම පිල්ටර් සකස් කරන ලද ආයතනයක් වෙතින් උපදෙස් ලබාගෙන ඉදිකිරීම් සිදුකරන ලෙස පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:15 පදික කඩ ඉදිකිරීමේදි වැඩි වූ කොන්ත්‍රාත් මුදල වන රු.160,297.57 මුදල ගෙවීම සඳහා සභා අනුමැතිය ගැනීම.**

පදික කඩ ඉදිකිරීමේදි වැඩි වූ කොන්ත්‍රාත් මුදල වන රු.160,297.57 මුදල ගෙවීම සඳහා සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමන් විසින් මෙම පදික කඩ පේළිය ඉදිරිපසින් ඇති අධි බලැති විදුලි රැහැන් පද්ධතිය හා කාණුවක් ඉදිකිරීමට සිදු වූ හෙයින් ඉහත මුදල් ප්‍රමාණය වැඩිවූ බව පවසා සිටින ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.12.06 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | 14,327,497.74 |
| **වෙනත් ලැබීම්** | 2,967,355.04 |
| **මුලු ලැබීම්** | 17,294,852.78 |
| **පුනරාවර්ථන වියදම්** | 13,501,897.70 |
| **වෙනත් වියදම්** | 2,301,125.00 |
| **මුලු වියදම්** | 15,803,022.70 |

**•ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 150-0248 | 1,350.00 |
| 227-5020 | 6,660.00 |
| 227-5020 | 23,850.00 |
| 227-5020 | 12,120.00 |
| 37-7933 | 1,485.00 |
| 56-1906 | 5,050.00 |
| BC-0005 | 32,360.00 |
| BC-0005 | 20,200.00 |
| CSM 0009 | 675.00 |
| DPP -0006 | 4,000.00 |
| DPP -0006 | 1,260.00 |
| DDR0008 | 530.00 |
| DDR0008 | 505.00 |
| fcon 0015 | 2,650.00 |
| GC 0001 | 5,900.00 |
| GC 0001 | 1,250.00 |
| FP 0002 | 8,400.00 |
| GK-1483 | 10,600.00 |
| GK-1483 | 4,040.00 |
| GK-6227 | 45,315.00 |
| GK-6227 | 1,076.00 |
| JD-4684 | 1,350.00 |
| JD-4684 | 1,250.00 |
| LL-2110 | 7,195.00 |
| LL-7688 | 3,922.00 |
| ND-5124 | 5,209.50 |
| | 24,804.00 |
| | 6,060.00 |
| OV/M0017 | 810.00 |
| PF-4006 | 24,750.00 |
| PF-4006 | 10,290.00 |
| QL-2901 | 3,577.50 |
| | 4,000.00 |
| RB-4786 | 6,345.00 |

| | |
|---|---|
| | 21,200.00 |
| RC-1107 | 17,490.00 |
| | 4,040.00 |
| RC-1118 | 21,730.00 |
| | 15,150.00 |
| VI-1833 | 422.55 |
| RD-8000 | 5,300.00 |
| RC - 8183 | 30,210.00 |
| RD-8240 | 11,810.00 |
| | 14,840.00 |
| MIXB-0011 | 2,170.00 |
| QR - 6976 | 675.00 |
| UQ - 1933 | 2,870.10 |
| 226-7521 | 12,720.00 |
| ZA - 5039 | 43,566.00 |
| ZA-5039 | 20,200.00 |
| **එකතුව** | **513,232.65** |

**08. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සුනන්දාරාමය ජල යෝජනා ක්‍රමය පිලිබඳ ඇස්තමේන්තු 3ක් ඉදිරිපත් කල අතර සභාවේ යෝජනා ස්ථිර වුවද එහි කටයුතු සිදු නොකෙරුන බවත් මේ පිළිබඳ බලවත් කනගාටුවට පත් වූ අතර මහජන ඡන්දයෙන් තේරී පත් වූ ජනතා නියෝජිතයෙක් වශයෙන් මෙහිදී එම මිනිසුන්ට ලබාදුන් පොරොන්දුව ඉදිරියේ මහත් අපහසුතාවයට පත්වූ බවත් පවසා සිටින ලදී. මෙලෙස කොට්ඨාශ අතරින් අඩුම අවධානයක් යොමු කර ඇත්තේ බුලත්ගම කොට්ඨාශයට බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී හෝ සාධාරණයක් ඉටුකරනු ඇතැයි උදක් අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් සුනන්දාරාමය ජල යෝජනා ක්‍රමය සඳහා සභාවේ මුදල් වැය කිරිමේදී එමගින් ලැබෙන ආදායම ජල සම්පත් මණ්ඩලයට වෙත යන බැවින් එහි ගැටළුවක් පවතින බවත්,මේ සඳහා සභාවේ මුදල් වැය නොකර වෙනත් ප්‍රතිපාදන ක්‍රමයක් මගින් මුදල් සොයාගත යුතු වන බැවින් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට

බලාපොරොත්තු වන බව පවසා සිටින ලදී. එමෙන්ම කොට්ඨාශ සඳහා පුද්ගලිකව සිතා කිසිදු අසාධරණයක් සිදු නොකල අතර ඉදිරි වර්ෂයේදි මෙම වසරේ ප්‍රමුඛස්ථානය නොලද කොට්ඨාශ සඳහා වැඩි සංවර්ධනයක් සිදු විය හැකි බැවින් ඉවසීමෙන් කටයුතු කරමින් සභාවේ කාර්යයන් සඳහා සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පසුගිය මාස 8 ක කාලය තුල සභාවේ විවිධ යෝජනා සම්මත කර ගනිමින් ව්‍යාපෘති ආරම්භ කලද තවමත් එම ව්‍යාපෘති සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ බවත් බලංගොඩ බස් නැවතුම්පොළ සිවිලිම ඉදිකිරීම,පුබුදමු ගම්මැද්ද වැඩසටහන අඛන්ඩව කරගෙන යාම, පුබුදමු ගම්මැද්ද වැඩසටහන කුමාරගම කොට්ඨාශයට ගෙන යාම වැනි සභා සම්මත වූ යෝජනා ක්‍රියාත්මක නොවී අතරමඟ නතර වී ඇති බවත් පෙන්වා දෙන ලදී.

එමෙන්ම දූනුගහමඩල වත්ත පාරේ සපත්තු බෝක්කුව සකස් නොකිරීම නිසා මන්ත්‍රී ප්‍රතිපාදන වැය කර ඉදිකරන ලද මාර්ගයේ අඩුවක් දක්නට ලැබෙන බවත් පවසා සිටින ලදී.තවද නව ගොඩනැගිලි පරිශ්‍රයේ ඉදිකිරීම් අතරමඟ නතර වී තිබීම පිළිබද සිහිපත් කර සිටි ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා විසින් මෙම කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් සම්පූර්ණ නොවූ ව්‍යාපෘති පිළිබඳව කටයුතු කරන ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින්, ලබා දුන් මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර දැනට රටේ පවතින අයහපත් ආර්ථිකය කවුරුත් දන්නා ගැටළුවක් බවත් පළාත් සභා 6ක් මේවන විට අක්‍රීය තත්වයේ පවතින අතර පළාත් සභා හරහා පළාත් පාලන ආයතනවලට මුදල් ගලාඒමක් සිදු නොවන බැවින් සංවර්ධනය අඩාල වීමක් සිදු වී ඇති බවත් පවසා සිටින ලදී.

එසේ නමුත් නගරයේ සංවර්ධන යෝජනා ඉටුනොකර සිටිමේදී ජනතාව උදෙසා සේවය කිරීමට නගරයේ ඇති උත්තරීතර ආයතනය වන නගර සභාව වගකිව යුතු වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා ඒ සඳහා සභාපතිතුමාට නීතියෙන් හිමි වී ඇති බලය

උපයෝගි කොට ගෙන දේශපාලන නායකයින් හමු වී මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා කැපවීම තුළින් හා පළාත් සභා මුද්දර ගාස්තු ලබාගැනීම තුළින් ජනතාව අපේක්ෂා කරන සංවර්ධනය 100% ඉටු කිරීමට හැකි නොවූවද ඉන් විශාල ප්‍රමාණයක් ඉටුකිරීම සඳහා ප්‍රතිපාදන ලබාගත හැකි බව පවසා සිටින ලදී.

තමන් තුළ කිසිදු දේශපාලන කුහකකමක් හෝ ඊර්ෂ්‍යාවක් නොමැති බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන්, ක්‍රියාශීලිව නිළධාරීන් සමග එක්ව වැඩකිරීම සඳහා තමා නිරන්තරයෙන් සහයෝගය ලබාදෙන බවත්, එවකට හිටපු සභාපතිතුමා ඉතා මහන්සියෙන් ඇමතිවරු හමුවී මුදල් ප්‍රතිපාදන ලබාගත් අයුරු මෙහිදී සිහිපත් කරන ලදී.බලංගොඩ ජනතාවගේ සංවර්ධනය උදෙසා සහාය දක්වීමට ඔවුන්ගේ බලාපොරොත්තු ඉටුකිරීම සඳහා තමන් උදක් කැපවී සහය දක්වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් සිය අදහස් දක්වීම අවසන් කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් අදහස් දක්වමින් තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ 4 ක මුදල් ප්‍රතිපාදන යොදවා ජලය නැති කමින් පීඩා විඳි විශාල පිරිසකට ජලය ලබාදීමට හැකියාව ලද බවත් එමෙන්ම තොසිල ගාර්ඩින් මාර්ගය සංවර්ධනය සඳහා ලබාදුන් ලක්ෂ 3.5 පමණ මුදල් ප්‍රතිපාදන සඳහාද ගරු සභාවට මෙහිදී ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී. එමෙන්ම තව තවත් මුදල් ප්‍රතිපාදන වෙන් කර ගෙන ජනතාවට අවශ්‍ය සංවර්ධනය ළඟාකර දීමට හැකියාව ඉදිරියෙදි සභාවට ලැබේවායි පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් 2019 වර්ෂය සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලක්ෂ 5 ක මුදලක් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේකුමාර මැතිතුමන් බලංගොඩ ප්‍රදේශයට විශාල අඩුවක්ව පවතින හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා හදිසි මරණ පරීක්ෂකවරයෙක් පත්කර දෙන මෙන් ගරු අධිකරණ අමාත්‍යවරිය දැනුවත් කර ඉල්ලීමක් කරන මෙන් මෙහිදී පවසා සිටින ලදී.

<u>**ගරු නාගරික මන්තිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**</u>

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් රට තුළ බස් ගාස්තු හා ත්‍රී විල් ගාස්තු අඩුකලද ත්‍රී වීල් හිමියන් තවමත් ත්‍රී වීල් ගාස්තු අඩුකිරීමක් දක්නට නොලැබෙන බවත් මේ පිලිබඳව යම් ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා සභාව මැදිහත්වන ලෙස ඉල්ලා සිටින ලදී. තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා අඩු ආදායම් ලාභී නිවැසියන් 11 දෙනෙකු සඳහා නිවාස අළුත් වැඩියා ද්‍රව්‍යයන් ලබාදුන් බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය ඉදිරියේදි සභාවේ සියළු දෙනාගේ සහභාගීත්වයෙන් එම ස්ථානයට යාමට බලාපොරොත්තුවෙන් සිටින බැවින් ඊට අවැසි සහය ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය 2018 වර්ෂයේ කමිටු පත්කර ගත්තද ඒවා ක්‍රියාශීලි මට්ටමේ නොමැති බැවින් 2019 වර්ෂයේ සිට හෝ මෙමගින් සිදු කෙරෙන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කර ක්‍රියාශිලී අයුරින් කමිටු පවත්වාගෙන යාම සුදුසු බව පෙන්වා දෙන ලදී.එමෙන්ම නගරය තුළ සභාවේ අවධානය යොමු නොවූ මාර්ග පිළිබඳ සොයා බලා නඩත්තු කටයුතු සිදු කර දීම පිළිබඳ සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා**</u>

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් නගර සභාවේ ළමා උද්‍යානය වෙත මේවන විට විශාල ජනකායක් දිනපතා පැමිණෙන බවත් එහි පිරිසිදු කම පිලිබඳව සැලකිලිමත් විය යුතු බවත් පවසා සිටින ලදී.කසළ බඳුන් බල්ලන් විසින් පෙරළා දමා අපවිත්‍ර කිරිම නිසා එහි අශෝභන තත්වයක් පසුගිය දිනෙක දුටු බවත් එම තත්වය වැළැක්වීම සඳහා සුදුසු පිළියමක් කඩිනමින් ගතයුතු බවත් පවසා සිටින ලදී.

එමෙන්ම ළමා උයන හා තුරු උයන එකට සම්බන්ධ කොට ක්‍රිඩා භාණ්ඩ ප්‍රමාණය වැඩිකර,කිරිහලක් ඉදිකර, එම ස්ථානය සඳහා මුරකරුවෙක් යෙදීම මගින් වැඩි ප්‍රතිලාභ රාශියක් ළගාකර ගත හැකි බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් මෙම උද්‍යානය පටන් ගැනීම කෙරෙහි මූලිකත්වය ලබා දුන් හිටපු නාගරික මන්ත්‍රී සමරසිංහ මැතිතුමන්ගේ නම ළමා උද්‍යාන නාම පුවරුවේ සඳහන් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා අදහස් දක්වමින් නගර සභාව මගින් ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘතින්හි නිසි නිමාවක් දක්නට නොමැති බවත්, කොටස් කොටස් වශයෙන් එක් එක් ස්ථානයන්හි වැඩ සිදු කරන බැවින් අපිළිවෙල බවක් දක්නට ලැබෙන බව පවසා සිටි අතර ඉදිරියේදි එම තත්වය විධිමත් කරගන්නා මෙන් පවසා සිටින ලදී.

පසුගිය කාලයේ අස්ථාවරව පැවති රටේ දේශපාලන තත්වය මේවන විට අවසන් වී රට ස්ථාවර ආණ්ඩුවක් සමඟ ඉදිරියට පිය නගමින් ඇති බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා බැරිවුන අපේක්ෂාවන් ඉටුකර ගනිමින් සංවර්ධනය කරා රට ගෙන යනු ඇතැයි පවසා සිටින ලදී. එමෙන්ම පාසල් ළමුන් එක වසරට ඇතුළත් කිරීමේදි නගරයේ ළමුන්ට සිදුවන අසාධාරණය පිලිබඳව ගරු සභාව මැදිහත් වන ලෙස ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා මෙහිදී ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී පී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රී පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ලක්ෂ 4 ක මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනා යොදවා ඉටුකරන ලද සංවර්ධන කාර්යයන් සම්පූර්ණ කරගැනීමට හැකි වූ අතර ඊට අමතරව ලබාදුන් ලක්ෂ 3 ප්‍රතිපාදන සඳහා ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී. තව දුරටත් තම කොට්ඨාශයේ 50% ක පමණ සංවර්ධනය කිරීම සඳහා අඩුපාඩු පවතින හෙයින්, ඉදිරි වර්ෂයේදිද කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා සභාවේ සහයෝගය බලාපොරොත්තු වන බව පවසා සිටින ලදී.

එමෙන්ම හුණු කුඹුර කෝපිවත්ත මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම නොබෝ දිනකින් සිදු කර දෙනු ඇතැයි අපේක්ෂා කරන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී පී.චන්ද්‍රලතා මැතිතුමිය, හුණු කුඹුර ආනන්ද මෛත්‍රිය මංසන්ධියේ කුණු කසළ දමා යන ගැටළුව සඳහා ගරු සභාව මැදිහත් වී විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින්, සභික නාම පුවරුව සඳහා 2018 ව ර්ෂයේ නගර සභාවට පත්වූ ගරු සභිකයන්ගේ නම් තවමත් ඇතුළත් නොවූ හෙයින් එය කඩිනමින් සිදු කරන ලෙස පවසා සිටි අතර සභිකයන් සඳහා කාර්යාලයක් ලබාදීමේ කටයුතු කඩිනම් කරන මෙන් පවසා සිටින ලදී. බලගොඩ නගරය සඳහා හදිසි මරණ පරීක්ෂකවරයෙක් නොමැති හෙයින් කල්තොට හා ඕපනායක පෙදෙස්වලින් මරණ පරීක්ෂකවරයෙක් කැඳවීමට සිදුවීමෙන් මහජනයාට සිදුවන පීඩාව වැළැක්වීම සඳහා අධිකරණ ඇමති තළතා අතුකෝරාළ මැතිනිය වෙත ඉල්ලීමක් සිදුකර හදිසි මරණ පරීක්ෂකවරයෙක් බලංගොඩට ලබාගැනීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් පවසා සිටින ලදී.

ගම් පෙරළිය එක් මැතිවරණ කොට්ඨාශයක් සඳහා මිලියන 300ක් වෙන් කරන ලද වැඩසටහන යටතේ පක්ෂ භේදයෙන් තොරව සියළු මන්ත්‍රීවරුන්ගේ යෝජනා ලබාගෙන සාධාරණව සියළු දෙනා සමඟ සහයෝගයෙන් එම වැඩ කටයුතු සිදු කිරීම සුදුසු බව පවසා සිටි ගරු උප සභාපතිතුමන් විසින් පළාත් සභා මාර්ගයක් වන කහටපිටිය මාර්ගයේ වැසි නැතිදාටත් ජලය රැඳී පැවතීමෙන් විශාල මිනිසුන් පිරිසක් පීඩාවට පත්වන බව පවසා සිටින ලදි. ප්‍රතිපාදන ගැටළු මතු වූ හෙයින් 2018 වර්ෂයේදි ජනතාව අපේක්ෂා කරන සංවර්ධනය ලබාදීමට නොහැකි වූ නමුත් ගැටළුසහගත තත්වයන් විසඳී 2019 වර්ෂයේදි ජනතාව අපේක්ෂා කරන සංවර්ධනය ඉටුකර දීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටි ගරු උප සභාපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් ලෙස තේරීපත්වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මැතිතුමන්ටත්, සබරගමු පළාත් නව ආණ්ඩුකාර ධම්ම දිසානායක මැතිතුමන්ටත් සුභ පැතීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් අදහස් දක්වමින් 2018 වර්ෂය තුළ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදුන් ලක්ෂ 4 මුදල් ප්‍රතිපාදන යොදවා සුභ සාධක සංගම් හා නිවාස සඳහා ආධාර ලබාදුන් බවත්, එලෙස ලබාදුන් බහුතරය එමගින් ප්‍රයෝජන ලබාගෙන තිබෙන බවත් පවසා සිටින ලදී.

මූකලන්වත්ත හා පල්ලෙකුඹුර යන සංවර්ධන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලැබී ඇති බවත් ඒ සඳහා ස්තූතිවන්ත වන බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය මූකලන්වත්ත මාර්ගයේ කඩාවැටී ඇති කොටස සඳහා ගරු සභාවේ කඩිනම් අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම මහමෙව්නා මාර්ගයේ ඩෙංගු අවධානමක් ඇති වීමට ඉඩ ඇති හෙයින් ගරු සභාවේ අවධානය ඒ සඳහාද යොමු කරන මෙන් පවසා සිටින ලදී. තවදුරටත් අදහස් දක්වමින් කම්කරු විනිශ්චය සභාව බලංගොඩ නගරයේ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය විමසා සිටි අතර කුමාරගම කසළ ට්‍රැක්ටරය ගමන් නොකරන පෙදෙස් හා ජලය නැති නිවෙස් කෙරෙහි ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් නගර සභා මන්ත්‍රීවරුන්ගේ නම් නාම පුවරුවේ සටහන් කිරීම කඩිනම් කල යුතු බවත් ගරු මන්ත්‍රීවරුන්ගේ නම් මෙන්ම උප සභාපතිතුමාගේ නම උප සභාපති නම් සහිත පුවරුවේ සඳහන් කරන මෙන් පවසා සිටින ලදී. එමෙන්ම මන්ත්‍රීවරුන්ට හිමි කාර්යාලය අද වන විට අහිමි වී ඇති බවත්, මෙවැනි මන්ත්‍රීවරුන්ට ඇති අයිතීන් කඩිනමින් ඉටුකරන ලෙසත් පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා කොට්ඨාශයක් සඳහා අයවැයෙන් ලක්ෂ 10 ක මුදලක් වෙන්කර තිබුනද තම කොට්ඨාශය සඳහා මේවන විටත් ලක්ෂ 7 ක පමණ කාර්යයන් පමණක් කර ඇති බව පවසා සිටි අතර වෙන් කරන ලද මුදල හෝ වියදම් නොකිරීම පිළිබඳව කනගාටුවට පත්වන බවත් පවසා සිටින ලදී.එය සභාවේ අකාර්යක්ෂමතාව ලෙස පැහැදිලිව පැවසිය හැකි අතර ජාතික තලයේ උපරිමයට ගිය සභාවක් ලෙස මෙවැනි දේ සිදුනොවිය යුතු බවත් පක්ෂවල න්‍යාය පත්‍ර අනුව වැඩ කලද මහජනතාවට සේවය කිරීමේදී මීට වඩා හොඳින් සිදු කරන ලෙස පවසා සිටින ලදී.

## 09. අවසානය

ගරු සභාපතිතුමා මෙහිදී අදහස් දක්වමින් ගරු සභිකවරුන් සඳහා සභාවේ දෙවරක් සම්මත කර ගන්නා ලද යෝජනාවකට අනුව ඉදිකරන ලද නව ගොඩනැගිලි පරිශ්‍රය පෙත්සම් ගසා කරන ලද කඩා කප්පල්කාරී ක්‍රියාවක් නිසා අතරමග නතර කිරීමට සිදු වූ බවත්, එමෙන්ම නගර සභාවේ පුරප්පාඩු රැකියා තනතුරු සඳහා බඳවාගැනීමට සභාවේ යෝජනා සම්මත කරගත්තද එයත් පළාත් සභාව වෙත ගොස් කණ්ඩායමක් විසින් කඩා කප්පල් කර දැමූ බව පවසා සිටින ලදී. එහෙයින් සභාවේ කාර්යයන් සිදු කර ගෙන යාමට හා ප්‍රජාව වෙත වැඩ කිරීමට ගරු සභාවේ සියළු දෙනාගේ දැනුම හා සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටි ගරු සභාපතිතුමා දේශපාලනයේ නොඉඳුල් ගමනක් යාම තම අභිප්‍රාය ද වන බව පවසා සිටින ලදී.

බස් නැවතුම්පොළ සිවිළිම , පුබුදමු ගම්මැද්ද වැඩසටහන, හා දූනුමඩල ගහවත්ත මාර්ගයේ සපත්තු බෝක්කුව ඉදිකිරීම ආදි කටයුතු ඉදිරියේදි කඩිනමින් සිදු කරන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් කොට්ඨාශයන්හි සංවර්ධන කටයුතු සඳහා දෙසැම්බර් මස ලක්ෂ 80 ක පමණ මුදලක් ලබාදී ඇති බවත්,නඩත්තු කටයුතු මේ වන විට ලක්ෂ 50 ට වඩා වැඩියෙන් සිදුකර ඇති බවත් පවසා සියින ලදී.

හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා බලංගොඩ ප්‍රදේශයට සුදුස්සකු ලබා දෙන මෙන් ගරු අධිකරණ අමාත්‍යවරියගෙන් ඉල්ලීමක් සිදු කරන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් 2019 වර්ෂයේ සිට කමිටු සියල්ල විධිමත් අයුරින් ක්‍රියාත්මක කල යුතු බවත්, කහටපිටිය මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා මේවන විට ලක්ෂ 120 ක පමණ මුදලක් අනුමත වී ඇති අතර,ඉදිරියේදි එම කටයුතු ආරම්භ කරන බවත් පවසා සිටින ලදී.එමෙන්ම ඉදිරියේදි මන්ත්‍රි ප්‍රතිපාදන මගින් කොට්ඨාශවල කාණු පද්ධතීන් සකස් කිරීමේ අපේක්ෂාවක් පවතින හෙයින් ඊට සම්බන්ධ යෝජනා ලබාදෙන මෙන් ඉල්ලා සිටි අතර දීර්ඝ කාලීන සංවර්ධනයක් උදෙසා වැඩකරමුයි යෝජනා කර සිටින ලදී.

පසුගිය දිනයන්හි සිදු වූ දේශපාලන අස්ථාවරත්වය සමග 2018 පාසල් නිළ ඇඳුම් වවුචර් ප්‍රමාදය, සුරක්ෂා රක්ෂණය,ගම්පෙරළිය මුදල් අහිමි වීම නිසා ගමට එන්න තිබූ සංවර්ධනය

අඩාළ වීම වැනි ක්‍රියාවන් සිදු වූ බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් නගර සභාවක් ලෙස මුද්දර ගාස්තු හා අනෙකුත් ආදායම් එකතු කොට ගෙන අයවැයට අනුව සාර්ථක ගමනක් යාමට අවශ්‍ය කටයුතු සිදු කරමුයි පවසා සිටි අතර,2019 වර්ෂය සැමට සුභ වේවායි,ජයෙන් ජය වේවායි ප්‍රාර්ථනා කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.1.30 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,

සභාපති

බලංගොඩ නගර සභාව